# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2168/5 - 2020 මාර්තු මස 24 වැනි අඟහරුවාදා - 2020.03.24

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය

මුද්‍රාව

ගෝඨාභය රාජපක්ෂ.

### ජනාධිපති විධානය

1. එස්. බී. දිවාරත්න මැතිතුමා
   විශ්‍රාමික නියෝජ්‍ය භාණ්ඩාගාර ලේකම්

2. වී. සිවඥානසෝති මැතිතුමා
   විශ්‍රාමික අමාත්‍යාංශ ලේකම්

3. මහාචාර්ය එච්. එම්. ඩබ්ලිව්. ආරියරත්න හේරත් මැතිතුමා
   ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය

4. මහාචාර්ය ශිරන්ත හීන්කෙන්ද මැතිතුමා
   කැළණිය විශ්වවිද්‍යාලය

5. ආචාර්ය එස්.එස්. සිවකුමාර් මැතිතුමා
   ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, යාපනය විශ්වවිද්‍යාලය

6. නිමල් අබේසිරි මැතිතුමා
   විශ්‍රාමික දිස්ත්‍රික් ලේකම්

7. අනුරුද්ධ පාදෙණිය මැතිතුමා
   විශේෂඥ වෛද්‍ය

8. වෛද්‍ය සජීවනී හපුදෙණිය මැතිතුමිය

9. සුමේධ පෙරේරා මැතිතුමා
   විශ්‍රාමික මේජර් ජනරාල්



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

10. ගයාත්‍රි ගුණරුවන් මැතිතුමිය

11. සංජීව ගුණවර්ධන මැතිතුමා
    විධායක නිලධාරී, ඊ.ඩබ්ලිව්. ක්‍රේසි සහ සමාගම

12. සමන්ත කුමාරසිංහ මැතිතුමා
    අධිපති, නේවර්ස් සීක්‍රට් ආයතනය

වෙත,

ශුභා ශිංසන පූර්වකවය!

ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 33 වන ව්‍යවස්ථාවෙන් මා වෙත පැවරී ඇති බලතල ක්‍රියාත්මක කරමින්, අංක 2159/64 හා 2020.01.25 දිනැති ගැසට් පත්‍රයේ පළ කරන ලද 2020 ජනවාරි මස 24 වැනි දින දරන ජනාධිපති විධානය මගින් දරිද්‍රතාවය තුරන් කිරීම සහ ජීවනෝපාය සංවර්ධනය සඳහා කාර්ය සාධක බලකායක් පිහිටුවා ඇති බැවින් ද,

එකී කාර්ය සාධක බලකාය මගින් ග්‍රාමීය හා අඩු ආදායම්ලාභී ජනතාව ගේ ජීවන තත්ත්වය නගා සිටුවීම සඳහා සපුරාලිය යුතු මූලික අවශ්‍යතාවයන් වන මූල්‍ය, අධ්‍යාපනය, සෞඛ්‍ය, ආහාර, සනීපාරක්ෂක හා අනෙකුත් යටිතල පහසුකම් කෙටි කාලයක් තුළ ළඟා කර දිය යුතු බැවින් ද,

තවද, යථෝක්ත කාර්යසාධන බලකායෙන් අපේක්ෂිත ප්‍රතිඵල ළඟා කරගැනීම සඳහා ක්ෂේත්‍රගතව ක්‍රියාත්මක වෙමින් තවදුරටත් මෙහි ක්‍රියාකාරකම් මහජනතාව වෙත ප්‍රවේශ කිරීමේ අවශ්‍යතාවය හඳුනාගෙන ඇති බැවින් ද,

තවද, මෙම කාර්යසාධන බලකායේ කාර්යයන් වසරක් වැනි කෙටි කාලයක් තුළ සම්පූර්ණ කිරීම අපේක්ෂා කරන බැවින් ද,

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති ධුරන්ධර ගෝඨාභය රාජපක්ෂ වන මම, **විශ්‍රාමික නියෝජ්‍ය භාණ්ඩාගාර ලේකම් එස්. බී. දිවාරත්න මැතිතුමා හා විශ්‍රාමික මේජර් ජනරාල් සුමේධ පෙරේරා මැතිතුමා** පූර්වෝක්ත ජනාධිපති විධානය ප්‍රකාරව පිහිටුවනු ලැබූ දරිද්‍රතාවය තුරන් කිරීම සහ ජීවනෝපාය සංවර්ධනය සඳහා කාර්ය සාධක බලකායේ සම සභාපතිවරු ලෙස මෙයින් පත් කරමි.

වර්ෂ දෙදහස් විස්සක් වූ මාර්තු මස 24 වන දින මෙදින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුද්‍රාව යටතේ දෙන ලදී.

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

**පී.බී. ජයසුන්දර,**
ජනාධිපති ලේකම්.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.